*නාට්‍ය හා රංග කලාව* **07 - 08 ශ්‍රේණි**

# නාට්‍ය පෙළක මූලිකාංග

## නාට්‍ය පෙළක මූලිකාංග

"යමක් කර පෙන්වීම " යන්න නාට්‍ය හැඳින්වීම සඳහා යොදු ගත හැකි සරලම නිර්වචනයි. මෙහිදී ඔබට "කර පෙන්වන්නේ කුමක්ද? " යන ගැටලුව මතු වෙයි .ඊට පිළිතුර වන්නේ යම්කිසි අපූරු සිදුවීමක් යන්නයි. මෙම සිදුවීම ප්‍රේක්ෂකයා ආකර්ෂණය කර ගත හැකි සිදුවීමක් විය යුතුමයි.

මෙම සිදුවීම කතාන්දරයක් හෝ අද්දැකීමක් වේදිකාවක් මත රඟ දැක්වීමට ප්‍රථමව නාට්‍යෝචිත වන අයුරින් රචනා කළ යතු වෙයි. මෙය 01.නාට්‍ය පෙළ

02. නාට්‍ය පිට පත

03.නාට්‍ය පෙළ සාහිත්‍ය , ලෙසින්ද හදුන්වනු ලැබේ. එසේම ඉංග්‍රීසි භාෂාවෙන් "drama script" ලෙසින්ද හඳුන්වයි.

නාට්‍ය පිට පත රචනා කරන්නා "පිටපත් රචකයා" "script writter" ලෙසින් හදුන්වයි.

විශේෂයෙන් පිටපතක් රචනා කිරීමේදී ,නාට්‍ය ලක්ෂණ අන්තර්ගත සුදුසු කතා පුවතක් ,අද්දැකීමක්,අවස්ථාවක් හෝ සිද්ධියක් ,මුල ,මැද හා අග ක්‍රමවත් අයුරින් ගැලපෙන සිදීයක් තෝරා ගත යුතු වෙයි.

උදා- මනමේ නාට්‍ය සඳහා පාදක වී ඇත්තේ "චුල්ල ධනුද්දර ජාතක කතාවයි" මෙහිදී එම ජාතක කතාවේ වැදගත් කොටස් යොදු ගනිමින් තවත් රසවත් කොටස් ද නාට්‍යට එකතු කර ගනිමින් පිටපත් රචකයා වන එදිරිවීර සරච්චන්ද්‍ර මහතා මනමේ නාට්‍ය පිටපත නිර්මාණය කර ඇත.

එසේම විවිද වූ ජන කතා ඇසුරින් බිහිවී ඇති නාට්‍ය ඇත. උදා- තොප්පි වෙළෙන්දගේ කතාව , අන්දෙරේගේ කතා, මහදැන මුත්තාගේ කතා, ......පෙන්වා දිය හැකිය.

මේ ආකාරයට කතා පුවතක්,සිදුවීමක්,ඇසුරු කොට ගෙන නාට්‍යක් රචනා කිරීමේදී නාට්‍යක මුලිකාංග හදුනා ගැනීම වැදගත් වෙයි.

නාට්‍ය පෙළක් රචනා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

01. නාට්‍ය සඳහා තෝරා ගත් කතා පුවතේ නාට්‍යෝචිත අවස්ථා මතු කරමින් මුල ,මැද හා අග මනා ලෙස ගැලපීම. ( එසේ නොමැතිනම්, ප්‍රේක්ෂකයන්ට නාට්‍ය රස විදීමට නොහැකි වෙනු ඇත.)
02. කතාවේ දැක්වෙන අදළ සිද්ධි හා අවස්ථා නාට්‍යයට උචිත පරිදි සකස් කළ යුතුය.
03. කතාවේ මුලික හරයට හානි නොවන පරිදි නාට්‍ය වස්තුව ගොඩනැගිය යුතුවේ.
04. නාට්‍යයේ සංවාද භාවිතය හා චරිත නිරූපනය වඩා ප්‍රබල විය යුතුය.
05. නාට්‍යයට උචිත පරිදි චරිත හසුරුවා ගත යුතුය.

***ඇගයීම***

01. පුවත් පත් සිදුවීම් කිහිපයක් එකතු කර පෙළ පොතෙහි අලවන්න.
02. එම පුවත් වලින් ඔබගේ සිත් ගත් එක පුවතක් ඇසුරින් කෙටි නාට්‍ය පිටපතක් නිෂ්පාධනය කරන්න.
03. විවිද නාට්‍ය වල පිටපත් සොයා කියවන්න.

උදා- තොප්පි වෙළෙන්ඳ
පුංචි අපට දැන් තේරෙයි,
මාගා සහ වලහා
අමාර ගිය දිව්‍යලෝකේ
නරිබෑනා
එලොව ගිහින් මෙලොව ආවා
දික්තල කාල ගෝල
රත්තරන්......වැනි නාට්‍ය පිටපත්.